සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 11 - ශ්‍රේණිය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02 යි.

සැලකිය යුතුයි:
- පළමුවන ප්‍රශ්නය තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) (1) රික්ත කපාටය භාවිතා කරමින් නිපදවූ පරිගණක යන්ත්‍ර දෙකක් නම් කරන්න.

(2) $1010001_2$ යන ද්විමය සංඛ්‍යාව, 16 පාදයට පරිවර්තනය කර ලියන්න.

(3) වාරක (cash) මතකය, අනෙකුත් මතක ඒකක වලට වඩා වෙනස් වන කරුණු දෙකක් ලියන්න.

(4) උපයෝගිතා මෘදුකාංගයක් නම්කර, එමගින් පරිශීලකයාට ඇතිවන පහසුකම ලියා දක්වන්න.

(5) පැරණි ඡායාරූපයක් ප්‍රතිනිර්මාණය කිරීමේ දී Gimp, Photoshop වැනි මෘදුකාංග යොදා ගැනේ. මෙම කාර්යයේ දී ස්ථර (Layers) කිහිපයක් යොදා ගැනීමෙන් පරිශීලකයාට ලැබෙන වාසි දෙකක් ලියන්න.

(6) පරිගණක ප්‍රක්‍රමණයේ දී (Programing) යොදා ගන්නා පාලන ව්‍යුහ පහත දැක්වෙන වගුවේ ඇති ප්‍රකාශන හා ගලපා ප්‍රකාශනයේ අංක හා ගැලපෙන පාලන ව්‍යුහය පිළිතුරු පතෙහි දක්වන්න.




| ප්‍රකාශනය | අංකය |
|---|---|
| ඉනිමගක පියවරෙන් පියර ඉහළ යාම | 1 |
| පන්තියේ සිසුන් එකිනෙකා පිරිමි හා ගැහැණු ලෙස වර්ග කිරීම | 2 |
| පරිමිත තියැදියකින් වයස අවුරුදු 15ට වැඩි සිසුන් පමණක් තෝරා ගැනීම | 3 |
| පෝලිමක සිටින මගීන්, ඉඩ තිබෙන තුරු පමණක් බස් රථයකට නංවා ගැනීම | 4 |

| පාලන ව්‍යුහය |
|---|
| වරණය |
| අනුක්‍රමය |
| පුනර්කරණය |

(7) වෙබ් අතිරික්සුවකට වෙබ් ලිපිනයක් ලබා දුන් විට අන්තර්ජාලයේ ඇති වෙබ් අඩවියක් දැක ගත හැකිය. මෙහිදී වසම් නාම සේවාදායක පරිගණකය මගින් සිදු කරන කාර්යය කුමක් ද?

(8) මෘදුකාංගයක නියම හිමිකරුට තම අයිතිය තහවුරු කර ගැනීම සඳහා නෛතිකව ලබා ගත හැකි විසඳුම කුමක් ද?


(9) පහත දැක්වෙන කෙවෙනි අංක හා එහි භාවිතය දැක්වෙන අක්ෂරය ගලපන්න.

| අංකය | කෙවෙනිය |
|---|---|
| 1 |  |
| 2 |  |
| 3 |  |
| 4 |  |


| අක්ෂරය | භාවිතය |
|---|---|
| A | බහුමාධ්‍ය තොරතුරු සම්ප්‍රේෂණය |
| B | ශ්‍රේණිගත ලෙස උපාංග කිහිපයක් සම්බන්ධ කිරීම |
| C | යතුරු පුවරුව හා මවුසය සබැඳීම |
| D | විඩියෝ තිරය සවි කිරීම |

ictnotes.org

(10) සමර්පණ මෘදුකාංගයක් භාවිතයෙන් සකසා ඇති පහත දැක්වෙන කදාවේ අංක 1, 2, 3, 4 මගින් දැක්වෙන අයිතම කදාවට එක් කිරීම සඳහා යොදා ගත යුතු විධාන, දී ඇති මෙවලම් තීරුව මගින් තෝරා ලියන්න.




මෙවලම් තීරුව




කදාව

(ලකුණු 2 × 10)

(02) ඊ - මාකර්ස් (E-Markers) ආයතනය දුෂ්කර පලාතක අඩු ආදායම්ලාභී දරුවන්ගේ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. පළමු පියවර ලෙස තෝරා ගැනීමේ පරීක්ෂණයකින් ලකුණු 50ට වැඩියෙන් ලබා සමත්වන දක්ෂ සිසුනට මෙම වැඩසටහන ආරම්භ කෙරේ.

(1) සිසුවකු සම්බන්ධයෙන් එම ආයතනය රැස් කළ හැකි යයි ඔබ සිතන දත්ත දෙකක් ලියන්න.

(2) තෝරාගත් සිසුවකු සම්බන්ධයෙන් ලබාගත හැකි තොරතුරක් ලියන්න.

(3) මෙම සිසුන්ගේ තොරතුරු රැස් කිරීම සඳහා යොදා ගත හැකි මෘදුකාංග දෙකක් ලියන්න.

(4) මෙවැනි ප්‍රදේශයක බෙහෙවින් සුලභ, අංකිත බෙදීම ඇතිවීමට බලපාන කරුණු දෙකක් ලියන්න.

(5) ඔබ මෙම ආයතනයේ කළමනාකරු නම් ඉහත කරුණු පිටුදැක අංකිත බෙදීම නැති කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2 × 5)

(03) වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා විද්‍යාලයීය ආපන ශාලාවේ සැපයුම් අංශය පරිගණක ගත කිරීමට අදහස් කර ඇත. මේ සඳහා සැකසූ දත්ත පාදකයේ ඇති වගු තුනක් පහත දැක්වේ.

සැපයුම්කරු වගුව

| සැපයුම්කරු කේත අංකය | සැපයුම්කරු |
|---|---|
| 012 | අතුල බේකර්ස් |
| 013 | සුමනදිසි රසකැවිලි |
| 014 | රුවන් කේටර්ස් |

අයිතම වගුව

| අයිතම කේතය | අයිතමය |
|---|---|
| B1 | සීනි බනිස් |
| B2 | මාළු පාන් |
| R1 | මාළු රෝල්ස් |
| P1 | එළවලු පේස්ට්‍රි |

අයිතම සැපයුම් වගුව

| අයිතම කේතය | සැපයුම් කේතය |
|---|---|
| B1 | 014 |
| B2 | 013 |
| R1 | 012 |
| P1 | 012 |

(1) දත්ත පාදක මෘදුකාංග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(2) "ප්‍රාථමික යතුර" හඳුන්වා සැපයුම්කරු වගුව සම්බන්ධයෙන් ඊට උදාහරණයක් දෙන්න. (ලකුණු 02)

(3) මෙම වගු තුනම තනි වගුවක් ලෙස සැකසීම මගින් වඩා හොඳ ප්‍රතිඵලයක් අත්වනු ඇතැයි කෙනෙකු තීරණය කරයි. මෙය විමසන්න. (ලකුණු 03)

(4) ආගන්තුක යතුර යන්න හඳුන්වා මෙම වගු සම්බන්ධයෙන් උදාහරණයක් දෙන්න. (ලකුණු 03)

ictnotes.org

(04) (අ) අන්තර්ජාලයෙහි මෙහෙයුම් ක්‍රියාවලිය සිදුවන ආකාරය පහත දැක්වේ. එම ආකාරය දැක්වෙන්නේ අනුපිළිවෙලින් නොවේ. නිවැරදි අනුපිළිවෙල ලැබෙන පරිදි එම වාක්‍ය වලට අයත් ඉංග්‍රීසි අක්ෂරය ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ලියා ඉදිරියෙන් අංක ලියන්න.

| මෙහෙයුම් ක්‍රියාවලිය | | අනුපිළිවෙල |
|---|---|---|
| වෙබ් අතරික්සුව URL එක DNS සේවාදායක පරිගණකයට යොමු කිරයි | A | |
| DNS සේවාදායකය මගින් URL හි දැක්වෙන නමට අදාල IP ලිපිනයට පරිවර්තනය කරයි | B | |
| පරිශීලකයෙක් වෙබ් අතරික්සුව විවෘත කර විශ්ව සම්පත් නිශ්චායකය (URL) ඇතුළත් කරයි | C | |
| IP ලිපිනය ඇති වෙබ් සේවාදායකය වෙත ඉල්ලීම යොමු කරයි | D | |
| වෙබ් අතරික්සුව මගින් HTML වෙබ් පිටුව දර්ශනය කරයි | E | |
| වෙබ් සේවාදායකය මගින් HTML දත්ත ප්‍රවාහයක් ආපසු ලබා දෙයි | F | |

(ලකුණු 03)

(ආ) "අන්තර්ජාලයෙහි ඇති වෙබ් අඩවියකට පිවිසුණ සෙව්වන්දි (A) එහි තිබූ වෙබ් අඩවියක් තනා උඩුගත කරන ආකාරය ගැන විස්තර කියවා ඉන් ලැබුණු දැනුම භාවිත කොට ඇය විසින් තනන ලද වෙබ් අඩවියක්, වෙබ් සර්වරයක් වෙත උඩුගත කළාය. (B)" මෙම ප්‍රකාශයෙහි දැක්වෙන විස්තරයෙහි A හා B අක්ෂර මගින් දැක්වෙන අවස්ථාවලදී ඇය භාවිත කළායි සිතිය හැකි නියමාවලි මොනවා ද?

A - ......................................................

B - ...................................................... (ලකුණු 01)

(ඇ) පාතිමා තමන්ට අවශ්‍ය වන කාර්යාලයීය මෘදුකාංගයක් තම පරිගණකයෙහි පිහිටුවීමෙන් තොරව අන්තර්ජාලය හරහා භාවිත කරයි.

A මෙවැනි එක් කාර්යාලයීය මෘදුකාංගයක් දක්වන්න. (ලකුණු 01)

B මෙම ක්‍රියාවලියට අයත්වන වලාකුළු පරිගණක සංකල්පය කුමක් ද? (ලකුණු 01)


(ඈ) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න. අසත්‍ය ප්‍රකාශ ඉදිරියෙන් ඒවා අසත්‍ය වන්නේ ඇයි දැයි දක්වන්න.

| ප්‍රකාශය | අක්ෂරය | සත්‍ය/අසත්‍ය | අසත්‍ය නම් ඊට හේතුව |
|---|---|---|---|
| වසම්නාම සේවාදායකයක් මගින් විද්‍යුත් තැපැල් හුවමාරු සිදුවේ. | A | | |
| දුරස්ථ පිවිසුම අනර්ථකාරී ලෙස යොදා ගැනීම Hacking වලදී සිදුවේ. | B | | |
| මාර්ගගතව විභාග ප්‍රතිඵල බැලීමේ දී එකම ගොණුව විශාල සේවා ග්‍රාහක ප්‍රමාණයකට භාවිත කිරීමේ අවස්ථාව සැලසේ | C | | |
| පරිශීලකයෙක් තමන්ට අවශ්‍ය බහු මාධ්‍ය ගොනුවක් ඉල්ලුම් කිරීමේ දී එය කෙලින්ම බහු මාධ්‍ය සේවාදායකය හරහා කිරීම සිදුවේ | D | | |

(ලකුණු 04)

ictnotes.org

(05) (අ) එක්තරා මාර්ගත පරිගණක ක්‍රීඩාවක නියැලීම සඳහා පරිශීලක අවසර පදය ලබා දිය යුතුය. එය අවස්ථා 3ක් තුළ නිවැරදිව ලබා දුන්නේ නම් පියවර 10ක් සහිත ක්‍රීඩාව ආරම්භ කළ හැක. එක් පියවරක් හෝ අසමත් වුවහොත් තරඟයෙන් ඉවත් කෙරෙන අතර පියවර 10ම නිවැරදිව අවසන් කළ විට ජයග්‍රහණය හිමි වේ. මෙම ක්‍රියාවලිය නිරූපණය කිරීම සඳහා අඳින ලද ගැලීම් සටහනක් පහත දැක්වේ. එහි A සිට E දක්වා අක්ෂර වලට ගැලපෙන නිවැරදි පිළිතුරු පහළින් දී ඇති කොටුව තුළින් තෝරා ඉංග්‍රීසි අකුර හා එයට අයත් පිළිතුර ඔබගේ පිළිතුරු පත්‍රයේ ලියන්න.




| |
|---|
| අවසර පද උත්සාහයන් ගණන <3 ? |
| අවසර පද උත්සාහයන් ගණන <=3? |
| තරඟ වටය සම්පූර්ණ කළේ ද? |
| තරඟවට ගණන = තරඟවට ගණන + 1 |
| තරඟවට ගණන = තරඟවට ගණන + 1 |
| තරඟවට ගණන >=10? |
| තරඟවට ගණන <=10? |
| අවසර පද උත්සාහයන් ගණන = 0 |

(ලකුණු 2 1/2)

(ආ)

```
Start
    Sum = 0
    Repeat
        Sum = Sum + 5
        Display (Sum)
    Until (Sum>50)
End
```

මෙම ව්‍යාජ කේතයට අදාල ගැලීම් සටහන ඇඳ දක්වන්න. (ලකුණු 05)

(ඇ) මෙහි දැක්වෙන්නේ num නැමැති ඒකමාන අරාවක් නිරූපණය කිරීම සඳහා අඳින ලද සටහනකි.

| num | | | | |
|---|---|---|---|---|
| | 10 | 15 | 25 | 0 |

```
Program array 1 ;
Var num:array[❶]of integer;
        I:❷;
Begin
num[❸]:=10;
num[3]:=0;
```

එයට ගැළපෙන පැස්කල් කේතය දකුණු පසින් දැක්වේ. එහි 1, 2, 3, 4, 5 හිස්තැන්වලට අදාල අංකය ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ලියා ගැලපෙන පිළිතුර ඊට ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 2 1/2)



ictnotes.org

(06) (1) පහත ලබාදී ඇති වගන්තිවල හිස්තැන් පිරවීම සඳහා සුදුසු වාක්‍යාංශය එක් එක් වගන්තිය අවසානයේ දී ඇති පිළිතුරු තුළින් තෝරා ප්‍රශ්න අංකය සහ අදාළ වාක්‍යාංශය පිළිතුරු පත්‍රයේ ලියන්න.

(a) වෙබ් අඩවි නිර්මාණයේ දී වැඩි ග්‍රාහකයින් ප්‍රමාණයක් රඳවා ගැනීම සඳහා එම වෙබ් අඩවියේ වෙබ් පිටුවල ව්‍යුහය හා පිරිසැලසුම ඉතා වැදගත් වේ. ........................................ වෙබ් අඩවිය සැකසීම මගින් විවිධ වර්ගවල පරිගණක වලින් වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ හැකියාව ලබා දේ.

(රූප වීඩියෝ සහ ශබ්ද ගොනු වල ධාරිතාවය අඩුවෙන් යොදා, තිරයේ ප්‍රමාණයට අනුව වෙබ් පිටුවේ ප්‍රමාණය සකස් වන ආකාරයට, පැහැදිලි වර්ණ මාලාවක් සහ අක්ෂර වර්ග භාවිතා කරමින්)

(b) ............................................... යන සංකල්පය භාවිතයට පැමිණීමත් සමගින් රූපමය අතුරු මුහුණතක් තුළ සැලසුම් කරන ආකාරයටම වෙබ් පිටු නිර්මාණය කරගත හැකිවීමෙන් වෙබ් සංස්කාරක මෘදුකාංග භාවිතය (Web authoring tools) වඩාත් ජනප්‍රිය විය.

(WYSIWYG, HTML, APACHE)

(c) වෙබ් අඩවියක අන්තර්ගතය බොහෝවිට දත්ත පාදකයක් මගින් හෝ සේවාදායකයේ භාවිත යෙදුමක් භාවිතයෙන් නිරන්තර වෙනස් වීම්වලට ලක්වේ නම් ඒවා ........................................ වෙබ් අඩවි ලෙස හඳුන්වයි.

(ගතික, ස්ථිතික, බහුමාධ්‍ය)

(d) වෙබ් අඩවි නිර්මාණ සහ සංවර්ධන පියවර තුළදී, පරීක්ෂා කිරීම ප්‍රකාශයට පත් කිරීමේ පියවරින් පසු සිදු විය යුත්තේ ................................ පියවරයි.

(සත්කාරක (hosting), සංකල්පමය (Conceptual), යාවත්කාලීන හා නඩත්තු (Update and maintenance)

(e) වෙබ් අඩවියේ අන්තර්ගත ක්‍රමවත්ව පිළිවෙලට පෙළගැස්වීම ..................................... ලෙස හඳුන්වයි.

(සන්ධාරය සංවිධානය (Content Management), ව්‍යුහය හා පිරි සැලසුම (Structure and layout), මාධ්‍ය සම්පත් තෝරා ගැනීම. (Using media resources)

(ලකුණු 05)



ictnotes.org

(2) රූපය 2 හි දැක්වෙන මූල කේතය භාවිතයෙන් නිර්මාණය වී ඇති රූපය 1 හි දැක්වෙන නිදර්ශක වෙබ් පිටුව සලකන්න.


**රූපය 1**

පහත රට වෙස්මුහුණු කෞතුකාගාරය

# <u>අම්බලන්ගොඩ උරුමය 1</u>

ශ්‍රී ලංකාව වෙස් මුහුණු සඳහා ඉතාමත් ප්‍රසිද්ධියක් උසුලන්නා වූ දිවයිනක් වේ. මෙම වෙස් මුහුණු කලාවේ ඉතිහාසය කොතරම් අතීතයට දිව යන්නේ දැයි අපට සාධාරණව කිව නොහැකි වුවත් අනුමාන වශයෙන් එය ශත වර්ෂ කිහිපයක් පමණ ඉපැරණි බැව් කිව හැක.

ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු සඳහා ප්‍රසිද්ධ වූ නගරයක් ලෙස දකුණු පළාතේ පිහිටි අම්බලන්ගොඩ දැක්විය හැක. කෙසේ වෙතත් මෙම නගරය වෙස් මුහුණු කැටයම් කිරීම සඳහා පමණක් නොව වෙස් මුහුණු අලෙවි කිරීම සඳහා ද ඉතාමත් ප්‍රසිද්ධියක් උසුලයි. විදේශීය සංචාරකයන් අතර ද මෙම අම්බලන්ගොඩ ප්‍රදේශයේ වෙස් මුහුණු ඉතාමත් ජනප්‍රිය වී තිබේ.




| මිළදී ගත් අයගේ නම | වෙස් මුහුණු වර්ගය | ප්‍රමාණය | ඒකක මිළ | මුලු මුදල |
|---|---|---|---|---|
| අනුරාධා | සන්නි | 1 | රු.1500.00 | රු.1500.00 |
| නෙලුම් | | 2 | රු.1500.00 | රු.3000.00 |
| සදුන් | නාග රාක්ෂ | 2 | රු.2000.00 | රු.4000.00 |
| අලෙවි කළ භාණ්ඩ වල මුලු එකතුව | | | | රු.8500.00 |

<u>දෛනික වෙස්මුහුණු අලෙවිය</u>

## වෙස්මුහුණු වර්ග කිහිපයක්

- රාක්ෂ මුහුණු
- දහ අට සන්නි මුහුණු
  1. භූත සන්නිය
  2. අභූත සන්නිය
- දිව්‍ය පුද්ගල මුහුණු
- කෝළම් මුහුණු

**රූපය 2**

```
<html>
<head><title>පහත රට වෙස්මුහුණු කෞතුකාගාරය</title></head>
<body>
<h1>< ❶ ><b><u>අම්බලන්ගොඩ උරුමය 1</u></b>
</ ❶ ></h1>
<p align="justify">ශ්‍රී ලංකාව වෙස් මුහුණු සඳහා ඉතාමත් ප්‍රසිද්ධියක්
උසුලන්නා වූ දිවයිනක් වේ. මෙම වෙස් මුහුණු කලාවේ ඉතිහාසය කොතරම්
අතීතයට දිව යන්නේ දැයි අපට සාධාරණව කිව නොහැකි වුවත් අනුමාන
වශයෙන් එය ශත වර්ෂ කිහිපයක් පමණ ඉපැරණි බැව් කිව හැක. </p>
<p align=" ❷ ">ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු සඳහා ප්‍රසිද්ධ වූ නගරයක්
ලෙස දකුණු පළාතේ පිහිටි අම්බලන්ගොඩ දැක්විය හැක. කෙසේ වෙතත්
මෙම නගරය වෙස් මුහුණු කැටයම් කිරීම සඳහා පමණක් නොව වෙස් මුහුණු
අලෙවි කිරීම සඳහා ද ඉතාමත් ප්‍රසිද්ධියක් උසුලයි. විදේශීය සංචාරකයන්
අතර ද මෙම අම්බලන්ගොඩ ප්‍රදේශයේ වෙස් මුහුණු ඉතාමත් ජනප්‍රිය වී
තිබේ. </p>
<br><imgsrc="banner.jpg" alt="අම්බලන්ගොඩ වෙස් මුහුණු
කෞතුකාගාරය" width="400" height="300" border="2"
align="middle">
< ❸ >
< ❹ border="1">
<caption align="bottom">< ❺ >දෛනික වෙස්මුහුණු
අලෙවිය</ ❺ ></caption></font>
<tr><th>මිළදී ගත් අයගේ නම</th><th>වෙස් මුහුණුවර්ගය</th>
<th>ප්‍රමාණය</th><th>ඒකක මිළ</th>
<th>මුලු මුදල</th></tr>
<tr><td>අනුරාධා</td><td ❻ ="2">සන්නි</td>
<td>1</td><td>රු.1500.00</td><td>රු.1500.00</td></tr>
<tr><td >නෙලුම්</td><td>2</td>
<td>රු.1500.00</td><td>රු.3000.00</td></tr>
<tr><td>සදුන්</td><td>නාග රාක්ෂ</td>
<td>2</td><td>රු.2000.00</td><td>රු.4000.00</td></tr>
<tr><td ❼ ="4">අලෙවි කළ භාණ්ඩ වල මුලු
එකතුව</td><td>රු.8500.00</td>
</table><p>
< ❽ >වෙස්මුහුණු වර්ග කිහිපයක්</ ❽ >
<ul type=" ❾ "><li>රාක්ෂ මුහුණු</li><li>දහ අට සන්නි මුහුණු</li>
< ❿ >
            <li>භූත සන්නිය</li><li>අභූත සන්නිය</li>
</ ❿ >
            <li>දිව්‍ය පුද්ගල මුහුණු</li>  <li>කෝළම් මුහුණු</li>
</ul></body></html>
```

**රූපය 2හි දැක්වෙන මූලකේතයේ 1 සිට 10 දක්වා ලේබල් කර ඇති තැන් සඳහා යෙදිය යුතු** HTML **උසුලන** (tag) **හෝ පද දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියන්න.**

**ලැයිස්තුව -** middle, center, hr, br, table, u, rowspam, colspan, h2, h1, disk, circle, ol, ul, right

**ලේබල අංකය සහ ඊට අනුරූප** HTML **උසුලනය/ පදය පමණක් පිළිතුරු පත්‍රයේ ලියන්න.**

**(ලකුණු 1/2 × 10 = 05)**



ictnotes.org

(07) S. C සෙනෙවිරත්න සමාගම වසර ගණනාවක් සිටම පොත් අලෙවියේ යෙදෙන සමාගමකි. පසු ගිය වසරේ සිට මාසික පොත් අලෙවිය හා ඉන් ආයතනය ලබා ගත් මුදල සොයා ගැනීමට විද්‍යුත් පැතුරුම් පතක් භාවිතා කරයි. ඒ සඳහා භාවිතා කරන ලද පැතුරුම් පතෙහි දත්ත ඇතුළත් කොටසක් පහත දැක්වේ.

| | A | B | C | D | E | F | G | H | I | J | K | L |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | | | | |
| 2 | | S.C.සෙනෙවිරත්න වෙළඳ සමාගමේ මාස පහක් තුළ පොත් අලෙවිය | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | |
| 4 | | පොතේ නම | පොතක මිළ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | මාස පහේදීම විකිණුනු මුළු පොත් ප්‍රමාණය | විකිණීමෙන් ලද මුළු ආදායම | විකුණූ පොත් සඳහා ලබා දුන් වට්ටම | වෙළඳ ආයතනයට ලැබුණු මුදල |
| 5 | | | | | | | | | | | | |
| 6 | | අංගනා | Rs:350.00 | 100 | 400 | 0 | 45 | 67 | 612 | Rs: 214,200.00 | Rs: 17.50 | Rs: 203,490.00 |
| 7 | | අහම්බකාරක | Rs:500.00 | 35 | 200 | 98 | 0 | 45 | 378 | Rs: 189,000.00 | Rs: 25.00 | Rs: 179,550.00 |
| 8 | | සෙංකොට්ටං | Rs:225.00 | 67 | 0 | 120 | 78 | 34 | 299 | Rs: 67,275.00 | Rs: 11.25 | Rs: 63,911.25 |
| 96 | | ගම්පෙරළිය | Rs:600.00 | 0 | 110 | 60 | 56 | 0 | 226 | Rs: 135,600.00 | Rs: 30.00 | Rs: 128,820.00 |
| 97 | | පහතරට ශාන්තිකර්ම | Rs:750.00 | 45 | 67 | 24 | 19 | 78 | 233 | Rs: 174,750.00 | Rs: 37.50 | Rs: 166,012.50 |
| 98 | | එක් එක් මාසයේ විකුණූ වැඩිම පොත් සංඛ්‍යාව | | 100 | 400 | 120 | 78 | 78 | 612 | | | |
| 99 | | මාර්තු සහ ජූනි මාස වලදී පමණක් විකිණුනු පොත් ප්‍රමාණය | 445 | | | | | | | | | |
| 100 | | වට්ටම | 5% | | | | | | | | | |


පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට ඉහත පැතුරුම්පත් කොටස උපයෝගී කර ගන්න.

(1) මාස 05 තුළදී විකුණන ලද මුලු පොත් ප්‍රමාණය සෙවීම සඳහා I 6 හි = function(cell1:cell12) ආකාරයේ ශ්‍රිතයක් ලියන ලද්දේ නම පිරවුම් හැඩලය භාවිතයෙන් අනෙක් කෝෂ වලට පිටපත් කළ විට I 96 කෝෂයේ දී එහි function,cell1,cell12 යන පදවලට අදාළ කොටස් ලියන්න.

(2) පොතක් අලෙවි කිරීමේ දී සමාගමේ ප්‍රතිපත්තියක් ලෙස සෑම පාරිභෝගිකයෙකුටම මිලදී ගන්නා සෑම පොතක් සඳහාම පොතේ මිළෙන් 5%ක වට්ටමක් ලබා දේ. "අහම්බකාරක" නම් පොත සඳහා ලබා දුන් වට්ටම් මුදල සෙවීමට K7 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය ලියන්න. (එම සූත්‍රය පිටපත් කිරීමෙන් අනෙක් කෝෂවල වට්ටම් මුදල් ලබා දිය යුතු අතර අවශ්‍ය කෝෂ හැඩසවීම (Cell format) සිදු කර ඇතැයි උපකල්පනය කරන්න.)

(3) මාර්තු සහ ජූනි මාස වලදී පමණක් අලෙවි කර ඇති මුලු පොත් ප්‍රමාණය ලබා ගැනීමට යොදා ගත හැකි සූත්‍රය තනි ශ්‍රිතයක් ලෙස ලියන්න.

(4) I 4 කෝෂයේ ඇතුළත් ලේබලය හැඩසවීම සඳහා යොදාගත් මෙවලම්, දී ඇති මෙවලම් තීරුවෙන් තෝරා ඒවාට අයත් ලේබලය/ ලේබල ලියන්න.




(5) විකිණීමෙන් ලද මුළු මාසික ආදායම සහ වෙළඳ ආයතනයට ලැබුන මුදල සංසන්දනය කිරීමට වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2 × 5)



ictnotes.org